# පිළිසඳර

# ගයන්ත කරුණාතිලක

***ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා එක්සත් ජාතික පක්ෂයේ තරුණ මන්ත්‍රීවරුන් අතර කැපී පෙනෙන කෙනෙකි. එසේම ඔහු එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය කථක ද වන්නේය. ශ්‍රීලංකාවේ බොහෝ දේශපාලන සිදුවීම් සම්බන්ධයෙන් එජාපයේ මත ප්‍රකාශන වලදී ගයන්ත කරුණාතිලක යන නම නිතර පුවත්පත් සහ විද්‍යුත් මාධයේ දක්නට ලැබේ. ඔහු අද ලංකාවිත්ති පිළිසඳරට එක්වෙයි***

**ඔ**හු ඉතා ප්‍රියමනාප එමෙන්ම කඩවසම් පුද්ගලයෙකි. කිසි දිනක දුම්පානයේ හෝ මත්පැන් පානය නොකළ කෙනෙකි. බෞද්ධ වත්පිළිවෙත් අනුව හැඩගැසුණු යහපත් පවුලකට ඔහු අයත්ය. මේ හැදියාව සමග දේශපාලනයට ජනතා සේවයට අවංකවම යොමු වීම තුළින් ඔහුට ඉතා දිගුගමනක් යාමට හැකියාවක් ශක්තියක් ඇති බව මනාව වැටහේ. වසර කීපයක් ලන්ඩනයේ ඉගෙනුම ලැබූ ගයන්ත කරුණාතිලක දේශපාලනයට යොමුවුණේ සිය බාප්පා වන හිටපු ඇල්පිටිය මන්ත්‍රීවරයා සහ නාවුක ඇමතිවරයාව සිටි රූපා කරුණාතිලක මහතා නිසා ය.

මේ නොබෝදා ගයන්ත ලන්ඩනයේ පැවති එක්සත් ජාතික පක්ෂයේ ලන්ඩන් ශාඛාවේ රැස්වීමකට එජාප පක්ෂ ලේකම් තිස්ස අත්තනායක සහ ගන්කන්ද මන්ත්‍රීවරයා සමග මෙහි පැමිණ සිටියේය. අප හිතවත් කීර්ති අමරසිංහයන්ගේ නිවසේදී එක් සැඳෑවක මට ගයන්ත හමුවිය. එහිදී මහා පරිමාණයේ දේශපාලන සාකච්ඡාවක් නොව අප රටේ වර්තමාන සමාජ තත්වය අනාවරණය කෙරෙන වැදගත් කරුණු කීපයක් ගැන ඔහුගෙන් විමසන්නට මට සිතිණ. මේ ඒ ප්‍රශ්නයන්ට ගයන්ත කරුණාතිලක මන්ත්‍රීවරයා දැක්වූ පිළිතුරු ය.

***දැන් කා අතරත් පවතින සාමාන්‍ය අදහස නම් පසුගිය දසවසරේ පටන් ශ්‍රීලංකාවෙ සදාචාරය හා ආචාරධර්ම දැඩි පිරිහීමකට පත්ව ඇති බව. මේ පිළිබඳව ඔබගේ අදහස් දැනගන්න කැමතියි.***

***ගයන්ත*** : ඔව්! ඒක සත්‍යයක්. ලංකාවෙ පුවත් පත් සහ විද්‍යුත් මාධ්‍යය පිරික්සා බැලුවොත් නිතර පෙනෙන දෙයක් අපරාධ සංඛ්‍යාව දිනෙන් දිනම වැඩිවෙමින් පවතින බව. මෙයට කලින් අපේ රටේ අසා නොතිබුණු විධියේ දරුණු අපරාධ අහන්න ලැබෙනවා. ත්‍රස්තවාදයට සමගාමීව සිවිල් සමාජයේත් අපරාධ වැඩිවෙලා. ඒ වගේම අපේ තරුණ තරුණියන් වැඩිදෙනා සංවරකමෙන් ඈතට යන බවත් පෙනෙනවා. නගරයෙන් එය ගමට පැතිරිලා ගිහින්. විනය දැඩි ලෙස පිරිහිලා. මෙය ඉතාම කණගාටු දායක තත්වයක්. මට මතකයි ඉස්සර පිටරට වල ඉන්න ශ්‍රීලාංකිකයන්ගෙ මතයක් තිබුණා, තමන්ගෙ දරුවන් ලංකාවට අරගෙන ගිහින් ඇති දැඩි කළොත් හොඳය කියලා. දැන් මතය වෙලා තියෙන්නෙ ළමයි ලංකාවට ගෙනාවොත් නරක් වෙයි, හදාගන්න බැරිවෙයි කියන අදහස., මෙයට බොහෝ පාර්ශව වගකිව යුතුය කියලා මම හිතනවා. රජයත් ඇතුළුව වැඩිහිටි පිරිස් මෙයට වඩා වගකීමෙන් කටයුතු කළ යුතුයි. දෙමව්පියන්, ඒ වගේම ආගමික අංශ ප්‍රධානීන්, ගුරුවරුන් ආදීන් අදර්ශමත්ව කටයුතු කිරීමෙන් හා සමාජයේ මෙම බිඳ වැටීම ගැන ජනතාව දැනුවත් කිරීමෙන් මේ සදාචාර හානිය වළක්වා ගැන්මට උත්සාහ කළ යුතුයි. ඒ වගේම මනාව ක්‍රියාත්මක වන දැඩි නීති පද්ධතියක්ද අපේ රටට අවශ්‍ය වෙනවා.

***ශ්‍රීලංකාවේ වර්තමාන තරුණ පරම්පරාව ගැන ඔබේ අදහස් මොනවාද? යම් දිනක රටේ අනාගතය බාරගන්නට සිටින ඔවුන් ඒ සඳහා සුදුස්සන් බවට පත්කිරීමට කළ හැකි දේ ගැන යමක් කියන්න.***

***ගයන්ත*** : සැබැවින්ම අද දවසේ අප රටේ සිටින තරුණ පරම්පරාව ගැන අපට සතුටු වෙන්න පුළුවන්. මම එහෙම කියන්නෙ මේ නිසා.



අපේ තරුණ පෙළ පෙරට වඩා අද උනන්දුවෙන් වැඩ කරනවා. අද ඒ අය ලෝකයේ සිද්ධවෙන දේවල් ගැන විමසිලිමත්ව ඉන්නවා. එය තාක්ෂණයේ දියුණුව නිසා වෙන්න පුළුවන්. අද අප රටේ හැම තැනකම වගේ මුල් තැන්වල ඉන්නෙ තරුණ උදවිය. ගුරුවරු, ලිපිකරුවෝ, බැංකු සේවකයො, රජයේ වෙනත් ආයතන, පෞද්ගලික අංශය, පත්‍ර කලාවේදීන් ඒ වගේම දේශපාලනයට පිවිසිලා ඉන්න අය, මේ ආදී සියළු තන්හි සභාපතිවරු, සාමාන්‍යාධිකාරීන්, විධායක නිලධාරීන් ආදී ඉහළ පුටුවල අද ඉන්නෙ තරුණ අය. මීන් පෙර මෙවැනි තත්වයක් තිබුණේ නැහැ. නිදසුනකට කියනවා නම්, ඉස්සර සමාගමක හෝ ආයතනක සේවයේ පළපුරුද්ද අනුව ක්‍රමයෙන් ඉහළම තැනට යන විට ඒ පුද්ගලයා බොහෝ විට විශ්‍රාම යන වයෝවෘද්ධ වයස. අද තත්වය වෙනස්. අද ඒ ඉහළම තැනත් සැහෙන තරුණ උදවියයි හොබවන්නෙ.

මෙය නොයෙක් අංශයෙන් පලදායී වෙනවා. තරුණ ජවය නිසා කඩිසරව ඉක්මනින් වැඩකෙරෙනවා. එය රටක ඉදිරි ගමනට ඉතා අවශ්‍යයයි. ඒ වගේම යම් වැරැද්දක් වුනත් ඒවා නිවැරදි කරගන්නත් ඒ තරුණ අයට අවශ්‍ය කාලය තිබෙනවා. අනික, අළුත් දේ ඉගන ගන්නත්, ඒවා අත්හදා බලන්නත් තරුණ අයගේ ඇත්තේ විශාල උනන්දුවක්. මේ සියල්ල සලකා බලන විට හරි උපදෙස් ලැබිලා ඉදිරියට යන්නට අවස්ථාව සලසලා දුන්නොත් අපේ තරුණ පෙළ රටේ අනාගතය බාරගන්න සුදුසු අය වෙන බව මට විශ්වාසයි.

***තරුණ පරම්පරාව ගැන කතාකරන කොට අද අප රටේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය ගැන කතා කරන්න වෙනවා. ඒ ගැන යමක් කියන්න. එය ඔබේ සතුටට හේතු වෙනවද?***

***ගයන්ත*** : වර්තමාන අධ්‍යාපනය සෑහෙන ව්‍යාකූල තත්වයක තියෙන්නෙ. අද අපේ රටේ අධ්‍යාපනය ඉතා තරඟකාරී තත්වයකට පත්වෙලා. සාමාන්‍ය පාසැල් සහ ජාත්‍යන්තර පාසැල් වශයෙන් දෙවර්ගයකට පාසැල් බෙදිලා. බොහෝ දෙමව්පියන්ගේ බලාපොරොත්තුව තමන්ගෙ ළමයා ජාත්‍යන්තර පාසැලකට දමාගන්න. ඒ සඳහා ඔවුන් අසීමිත ලෙස මහන්සි වෙනවා. බැරි වුනත් මුදල් වියදම් කරනවා. ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ වටිනාකම දැන් මතුවී ඇවිත් තිබෙනවා. ජාත්‍යන්තර පාසැල් පසුපස දුවන්න එයද එක් හේතුවක්. ගම්බද බොහෝ පාඨශාලා මේ නිසා වසා දමන තත්වයක් ඇතිවෙලා. මොකද ළමයි ඒවායේ හිඟ නිසා. ටියුෂන් පන්ති වලට ළමයි යැවීමත් දැන් රට පුරාම පුරුද්දක්. කුඩා පන්තිවල ළමයි පවා විශාල පොත් ගොඩවල් උස්සගෙන යනවා අපට පේනවා.

ඉගෙනීම ළමා මනසට බලෙන් ඔබනව කියලා සමහරු කියනවා. ළමයි අතරත් ඉගෙනීමට තියෙන්නෙ තරඟයක්. ඒ තරඟෙට දෙමාපියනුත් හවුල්. ඒ සමගම පේන තව දෙයක් තමයි ටියුෂන් යන්නෙත් නැතුව සාමාන්‍ය පාසැලකට ගිහිල්ලා මුළු දිවයිනෙන්ම ඉතා උසස් ලෙස



සමත් වුණු ගම්බද ළමයි ඉන්නවා. මෙයින් පේනවා පහසුකම් අඩු ගම්බද පළාත්වල පවා හොඳ අධ්‍යාපනයක් ඇත්නම් උසස් ප්‍රථිඵල ලබාගත හැකි බව. දැනට ඇති මේ තරඟකාරී බව නවත්වලා අප රටේ අධ්‍යාපනය උසස් පහත් යනුවෙන් වර්ග නොකර හැම දරුවෙකුටම සෙත සැලසෙන විදියට සකස් කිරීමේ වැඩ පිළිවෙලක් වහාම දියත් කළ යුතුයි කියලයි මම කියන්නෙ.

***අද අපේ ලාංකික සමාජයේ කාන්තාවගේ තත්වයේ දියුණුවක් සිදුව ඇතැයි ඔබ සිතනවාද? එසේ නම් ඒ කුමන ආකාරයටදැයි පහදා දෙන්න. එසේ නැත්නම් ප්‍රගතියක් සඳහා ගත යුතු පියවරවල් මොනවාදැයි කියන්න.***

***ගයන්ත*** : අපේ ලාංකික සමාජයේ කාන්තාවගේ සමාජ මෙහෙවර පෙරට වඩා අද ප්‍රබලයි. මම අපේ තරුණ පෙළ පිළිබඳව මුලින් කී කරුණුම අපේ කාන්තාවන් ගැනද කියන්නට පුළුවන්. අද ඇය සිටින්නේ ඉතා ඉදිරියෙන්. පිරිමින් හා සමසමව සමාජයේ කටයුතු වගකීමෙන් යුතුව කරන්නට පුළුවන් තත්වයක. අමතක කරන්න නරකයි අප රටේ තමයි ලොව ප්‍රථම අගමැතිවරිය මෙන්ම, ප්‍රථම විපක්ෂ නායිකාවද බිහිවුණේ. අද දවසේ කාන්තාව අපේ සමාජය තුළ හැම අංශයකම දස්කම් දක්වා තිබෙනවා. රැකියා මට්ටමෙන්ද ඉතා ඉහළ තනතුරු දරනවා. ව්‍යාපාරික කටයුතු වල නිරතවෙලා සිටිනවා. විශේෂයෙන් මැද පෙරදිග හා යුරෝපයේ රටවල ලක්ෂ ගණනක් ලාංකික කාන්තාවො රටට කෝටි ගණනක් විනිමය උපයා දෙනවා. එයම ප්‍රමාණවත් ඇයගේ සේවාව සහ කැපවීම මනින්න.

එහෙත් මේ සියළුම කැපවීම් අතරේ ලාංකික සමාජයේ කාන්තාවට දක්වන අකාරුණික සැලකීම ගැනත් කිවයුතුයි. ඇයට ලැබෙන ගැරැහුම් නින්දා අපහස මෙන්ම තාඩන පීඩන ද එමටයි. ලිංගික අතවරයනට ගොදුරු නොවී බසයක වාහනයක අද කාන්තාවකට ගමන්කිරීම අපහසුයි. මග තොට යන විට ද, රැකියාවෙන් පසු නිවෙස් කරා යන විට ද ඇය අතවරයන්ට නිතර මුහුණ පානවා. රැකියාව කරන ස්ථානයන්හි දි පවා ඇය ඒවාට ගොදුරු වෙනවා. ඇයට ඇති ආරක්ෂාව ඉතා මදි. ඒ වගේමයි ගෘහ ප්‍රචන්ඩත්වයට (domestic violence) ගොදුරුව සිටින කාන්තාවක්ගේ සංඛ්‍යාව ද ඉතා විශාලයි. මේ සියළු ආපදාවන්ගෙන් කාන්තාවන් මුදා ගැන්ම සඳහා අවශ්‍ය දැඩි නීති රීති හැකි ඉක්මනින් සම්පාදනය කොට, ඒවා අකුරට ක්‍රියාත්මක කිරීම රජයේ වගකීමයි.

***මාධ්‍ය නිදහස ගැන යමක් කියන්න.***

***ගයන්ත*** : ලංකාවෙ මාධ්‍ය නිදහස ඉතා කණගාටුදායක තත්වයකට පහතට වැටී ඇති බව කියන්න ඕන. මාධ්‍ය ආයතනවලට කෙරෙන තර්ජණ හා බලපෑම් තවම නැවතිලා නැහැ. ඔබ අසන්න දකින්න ඇති, මෑතක දී රූපවාහිනී ආයතනයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකට පහරදීම. ඒ වගේම මාධ්‍යකරුවන්ගේ ගෙවල් වලට ගොස් තර්ජණය කිරීම. මේ දේවල් සිදුවෙද්දී මාධ්‍ය නිදහසක් ගැන හිතන්න පුළුවන්ද? ඒක පාක්ෂික ප්‍රවෘත්ති පළකිරීමෙන් රටවැසියාට ඇත්ත දැනගන්නට තිබෙන ඉඩප්‍රස්ථා නැතිවෙනවා. විවිධ මත ඉවසන්න අපි පුරුදුවෙන්න ඕන. විවේචනයන්ට මුහුණ දෙන්න ඕන. අවශ්‍ය නම් පුවත් වාරණය කළාට කමක් නෑ. ඒත් මාධ්‍යකරුවන්ට හිරිහැර කිරීම ලෝකයා හමුවේ රටේ හොඳ නමට කරගන්නා හානියක් හැටියටයි මම දකින්නෙ.

——————— **වෙනුර**

1 වෙනි පිටුවෙන්

## අධිෂ්ඨානයෙන් ඉදිරියට....!

එදා තිබුණේ ඇමරිකාව සහ යුරෝපය ඇතුළු බටහිර රටවලටය. නමුත් අද විවෘත ආර්ථිකය හා ගෝලීය කරණය ඉතා දක්ෂ ලෙස හැසිරවූ චීනය. ඉන්දියාව. මැලේසියාව ප්‍රමුඛ පෙරදිග රටවල්ද. ඉරානය. වෙනිසියුලාව වැනි තෙල් රටවල් ද මේ වෙනස ඇතිකිරීමට මුල් වී ඇත. එසේ කිරීමෙන් එදා බටහිරට නැඹුරුව තිබුණු බල තුලනය සිය පැත්තට නම්මවාගෙන ඇත. එම රටවල ඇති විශාල මිනිස් ශ්‍රමය හා ධන සම්පත්ද රාජ්‍ය කේන්ද්‍රීය සැලසුම් ප්‍රධාන කොට නිවැරදිව හසුරුවාලීම තුළින් එම රටවල් මෙම ජයග්‍රහණය ලබාගෙන තිබේ. එසේම ඉදිරියට ගොස් සිටිති.

ඇමරිකාව ඩොලර් ට්‍රිලියනයකටත් වඩා වැඩි ප්‍රමාණයක් චීනයට ඇති වෙළඳ ශේෂය තුළින්ම ණය ගැතිව ඇත. ඇමරිකාව හා බ්‍රිතාන්‍යය උග්‍ර බැංකු අර්බුද වලට මුහුණ දී ඇති අයුරු ඊයේ පෙරේදා අපි දුටුවෙමු. අද මෙම රටවල ආර්ථිකයන් හරියටම ගරා වැටෙන පරණ වළව්වල තත්වයට පත්ව ඇත. කලෙක ලෝකයටම බලපරාක්‍රමය පෙන්වූ මෙම අධිරාජ්‍යවාදීහු අද බංකොලොත් භාවයට වැටෙමින් සිටිති. තවමත් පරණ තාලයට පුප්පන්නට හැදුවද අද ඔවුන් ගැන අන් රටවල් වැඩි තැකීමක් නොකරති.

යථාර්ථය නම් මෙයයි. මෙය නිවැරදිව හඳුනාගෙන ඇති අපේ රටද අපේ සත්‍ය මිතුරන් තෝරා බේරාගෙන සිටිනු දැක්ම සතුටට කරුණකි. අප දැන් චීනය හා ගොඩනගාගෙන ඇති මිත්‍ර සම්බන්ධයද, මැලේසියාව හා ඉරානය වැනි රටවල් සමග ගොඩනගාගෙන ඇති නව සබඳතාද මෙයට නිදසුන්ය.

ගිය නොවැම්බරයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ඉරාන ගමනට පසු ඉරාන ජනාධිපති මොහොමඩ් අහමඩ් නෙජාඩ් මහතාද ලංකාවේ දින තුනක චාරිකාවක යෙදිණ. ඒ ගමනේදී සපුගස්කන්ද තෙල් පිරිපහදුව විශාලකිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 750ක් අපට ආධාර ලෙස දෙන ගිවිසුමක් සහ වැල්ලවායේ උමා ඔය ව්‍යාපාරය සඳහා ඩොලර් මිලියන 450 ක් සඳහා ගිවිසුමක්ද අත්සන් කෙරිණ. සපුගස්කන්දේ දැන් නිශ්පාදනය කරන පිරි තෙල් බැරල් 50000 ක ප්‍රමාණය තව බැරල් ලක්ෂයකින් වැඩිකරමින් තෙගුණ කිරීමට මෙය උදව්වනු ඇත. එවිට අප රටට අවශ්‍ය ගුවන්යානා තෙල් හා තාර, බියුටමන් වැනි ද්‍රව්‍යවලින් ද අපරට ස්වයංපෝෂිත වනු ඇත. මෙවැනි නව ගිවිසුම් හයකින් අපට මුළුමනින් ඩොලර් බිලියන 1.9 ක් ආධාර ලැබේ.

## කොටින්ට නරක දසාවක්

කැනඩාවේ මෙයට පෙර බලයේ සිටි ලිබරල් පක්ෂය පරදවා කොන්සර්වේටිව් රජයක් පිහිටුවීමෙන් පසු ක්‍රමයෙන් එහි නිදැල්ලේ පිනුම්ගසමින් සිටි කොටි ව්‍යාපාරයට මුදල් රැස්කරමින් සිටි තක්ඩින් රාශියක් අත් අඩංගුවට ගෙන ඇත. දැන් බ්‍රිතාන්‍ය පොලීසියද මෙවැනි පරීක්ෂණවල යෙදෙමින් සිටිති. පසුගිය දිනවල **WTM** නම් කොටි පෙරටු සංවිධානයට මුදල් රැස්කළ තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර ලන්ඩනයේ ටූටිං හි කොටින්ගේ මුද්‍රණාලයකට සීල් තබා එහි අයිතිකරුවන් ගැන පරීක්ෂණ සිදුවන බව පළවිය.

පසුගිය සතියේ ලන්ඩනයේ පැවති නගරාධිපතිවරණයෙන් කලින් දෙවරක්ම දිනා සිටි කෙන් ලිවිංස්ටන් පරාදවීම ද කොටින්ට වැදුණු මරු පහරකි. ඉදිරි මහ ඡන්දයේදී ලේබර් පක්ෂය නිසැකවම පරදින බවද දේශපාලන නිරීක්ෂකයෝ කියති. මෙයද ලේබර් සහාය ලද කොටින්ට නරක ලකුණකි.

ඒ සමගම ඊයේ පෙරේදා තමිල් නාඩුවේ කොටින්ට සහාය දෙමින් සිටි කරුණානිධි හදිසියේ බඩ පිළුමක් ගසමින් ප්‍රභාකරන්ගේ ඊළාම් අදහස සිහිනයක් බවත්, එය සිහිනයක්ම වනු නියත බවත්, එහි මන්ත්‍රණ සභාවේදී ප්‍රකාශකොට ඇත. මෙයද කොටින්ට තද බල පහරකි. මේ කරුණු අනුව කොටින්ට ඉදිරියට ඉතා නරක දසාවක ලකුණු පෙනෙන්ට පටන්ගෙන ඇත.